# නිදහසින් පසු සංවර්ධන කටයුතු

## 6.2 ක්‍රියාකාරකම් පත්‍රිකාව

1) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කළ අරමුණු මොනවාද?

2) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර කුමක්ද?

3) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයෙ පළමු අදියර මගින් පෝෂණය වන වැව් මොනවාද?

4) 1977 බලයට පත් ජේ ආර් ජයවර්ධන මහතාගේ රජය කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය සඳහා යෝජනා කළ වැඩපිළිවෙල කුමක්ද?

5) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදි වූ ජලාශ මොනවාද?

6) එමගින් ඉදිවූ උමං දෙකක් හා ජල හැරවුම් මධ්‍යස්ථානයක් ලියා දක්වන්න.

7)මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදි වූ පහත සඳහන් ජලාශ සඳහා ආධාර ලබා දුන් රටවල් මොනවාද?

- කොත්මලේ ජලාශය
- වික්ටෝරියා ජලාශය
- රන්දෙණිගල ජලාශය

8) ලංකාවේ ව්‍යාපාරික කෘෂිකර්මාන්තයේ දියුණුවට නිදහසින් පසුව රාජ්‍ය අංශය සතු ඉඩම් කළමනාකරණය සඳහා ආයතන කිහිපයක් පිහිටුවන ලදී එම ආයතන මොනවාද?

9 ) 1972 වර්ෂයේදී ලංකාවේ මුලින්ම පිහිටවන ලද සුළු අපනයන පර්යේෂණ ආයතනය කුමක්ද?

10) ඉන්පසුව පිහිටවන ලද සුළු අපනයනලු අපනයන පර්යේෂණ ආයතන මොනවාද ?

11) 1948 වර්ෂයෙන් පසු මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණ 5ක් ලියා දක්වන්න .

12) නිදහසින් පසුව ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය සේවා දියුණු කිරීමට විශේෂ අවධානයක් යොමු කෙරුණු අතර ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග මොනවාද?